අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පහළ වූ දිව්ය පණිවිඩයේ ආරම්භය (එතුමා තම) නින්දේදී දුටු දැහැමි සිහිනය විය

දේව විශ්වාසීන්ගේ මෑණියක වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පහළ වූ දිව්ය පණිවිඩයේ ආරම්භය (එතුමා තම) නින්දේදී දුටු දැහැමි සිහිනය විය. එවිට අළුයමේ උදාව මෙන් මිස එම සිහිනය එතුමාණන් වෙත පැමිණියේ නැත. පසුව එතුමාණන් වෙත හුදෙකලාව ප්රිය විය. එතුමාණෝ හිරා ගුහාවේ තනි වෙන්නට වූහ. තම නිවසට යෑමට පෙර එහි දී රාත්රී ගණනාවක් නැමදුමෙහි නිරත වූහ. ඒ සඳහා අවශ්ය බඩු මළු සකසා ගත්හ. පසුව එතුමාණෝ හිරා ගුහාවෙහි සිටිය දී සත්යය එතුමාණන් වෙත පැමිණෙන තෙක් ඒ අයුරින්ම කදීජා තුමිය වෙත නැවත හැරී ගොස් බඩු මළු සකස් කර ගත්හ. එහිදී සුරදූතයා ඔහු වෙත පැමිණ: "ඔබ කියවනු" යැයි පැවසීය. එතුමාණෝ "මා කියවන්නෙකු ලෙස නැත" යැයි පැවසූූහ පසුව හෙතෙම මා අපහසුතාවයට පත්වන තරමට මා තදින් අල්ලා බදා ගෙන අනතුරුව මා අත්හැර දැමීය. පසුව ද ඔහු "ඔබ කියවනු" යැයි පැවසීය. එවිට ද මම "මා කියවන්නෙකු ලෙස නැත" යැයි පැවසුවෙමි. පසුව දෙවන වරටද මා අපහසුතාවයට පත්වන තුරු මා තදින් අල්ලා බදා ගෙන, අනතුරුව මා අත්හැර දමා නැවතත් ඔබ කියවනු යැයි පැවසීය. එවිට ද මම "මා කියවන්නෙකු ලෙස නැත" යැයි පැවසුවෙමි. පසුව තුන්වන වරටද මා අපහසුතාවයට පත් වන තරමට මා තදින් අල්ලා බදා ගෙන පසුව මා අත්හැර දමා මෙසේ පැවසීය.: "මැවූ ඔබේ පරමාධිපතිගේ නාමයෙන් කියවනු. ඔහු කූඩැල්ලකුගේ හැඩයකින් මිනිසා මැව්වේය. කියවනු. ඔබේ පරමාධිපතියණන් අති ගෞරවණීයය." (අල්-අලක්: 1-3) පසුව අල්ලාහ්ගේ දූතයාණෝ තම හදවත තිගැස්සුනු තත්ත්වයෙන් එය රැගෙන පැමිණියහ. පසුව කදීජා බින්ත් කුවෙයිලිද් (රළියල්ලාහු අන්හා) තුමිය වෙත පිවිස "මා පොරවනු; මා පොරවනු." යැයි පවසා සිටියහ. එතුමාගෙන් බිය පහව යන තෙක් ඔවුහු එතුමාණන්ව පොරවා දැමූහ. එවිට එතුමාණෝ කදීජා දෙස බලා සිදු වූ පුවත ඇයට පවසා සිටියහ. "මම මා ගැන බිය වෙමි" යැයි පැවසූ විට කදීජා තුමිය: "එසේ නොව, අල්ලාහ් මත දිවුරා පවසමි. කිසිදිනක අල්ලාහ් ඔබව දුකට පත් කරන්නේ නැත. සැබැවින්ම ඔබ ඥාති සම්බන්ධකම් හොදින් පවත්වා ගෙන යන්නෙහිය. සැමට උපකාර කරන්නෙහිය. නැතිබැරි උදවියට උපයා දෙන්නෙහිය. ආගන්තුකයින්ට සත්කාර කරන්නෙහිය. සත්යය පවතින පැත්තට උපකාර කරන්නෙහිය" යැයි පැවසුවාය. පසුව කදීජා තුමිය එතුමාණන්ව කැටුවා ගෙන කදීජා තුමියගේ බාප්පා කෙනෙකුගේ පුත් වර්කත් ඉබ්නු නව්ෆල් ඉබ්නු අසද් ඉබ්නු අබ්දුල් උස්සා වෙත ගියහ. හෙතෙම අඥාන යුගයේ කිතුනු දහම හැදෑරූ තැනැත්තෙකු විය. අබරානි බසින් පොත්පත් ලියන ලේඛකයකු විය. ඉන්ජීල් හෙවත් බයිබලය අල්ලාහ්ගේ අභිමතය අනුව අබරානී බසින් ලියා නිම කළේය. හෙතෙම අන්ධ භාවයෙන් යුත් වයෝවෘද්ධ ප්රභූවරයකු විය. එවිට කදීජා තුමිය ඔහුට: "මාගේ බාප්පාගේ පුතනුවනි! ඔබේ සහෝදරයාගේ පුතුට සවන් දෙන්න." යැයි පැවසුවාය. එවිට වරකා එතුමාණන්ගෙන්: "මාගේ සහෝදරයාගේ පුතුනි! ඔබ දුටුවේ කුමක්දැ?" යි විමසා සිටියේය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ තමන් දුටු දෑහි පුවත සැලකර සිටියහ. එවිට වරකා තුමා එතුමාණන්ට: "ඔහු, මූසා වෙත පහළ කළ නාමූස් නම් සුරදූතයා වෙයි. එහි මටත් කොටසක් තිබුණා නම් මැනව! ඔබේ ජනයා ඔබව පිටුවහල් කරන අවස්ථාවේ මා ජීවතුන් අතර සිටියා නම් මැනව!" යැයි පැවසීය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ "ඔවුන් මා පිටුවහල් කරනු ඇත්දැ?"යි විමසා සිටියහ. හෙතෙම: 'ඔබ ගෙනා දේ නැවත ආවර්ජනය වීම හැර එවන් වෙනත් කිසිවක් කිසිදු

[متفق عليه] [صحيح]

http://www.sunnah.global/hadeeth/si/show/66303